14

දෙපාර්තමේන්තු චක්‍රලේඛ :- 08/2010

මගේ අංකය :- ඩී1/10/85(111),
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2010.02. 05

මූලස්ථානයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

<u>බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකයක් ස්ථාපිත කිරීම.</u>

බන්ධනාගාර ආයතනවල ආරක්ෂක කටයුතු මැනවින් පවත්වාගෙන යාමට හා සෝදිසි මෙහෙයුම් සිදු කිරීම වශයෙන්, බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකයක් 2010.01.23 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නිළ වශයෙන් ස්ථාපිත කර ඇත. මෙම ඒකකයට බඳවා ගන්නා ලද සියළුම නිලධාරීන් පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති අතර, අධ්‍යක්ෂ පුහුණු/ මූලස්ථාන අධිකාරී - ඒ.හපුආරච්චි මහතා ක්‍රියාත්විත සහ පාලන රාජකාරීන්, සම්බන්ධීකරණය කිරීම සඳහා පත් කර ඇත. එම ඒකකයෙහි නිලධාරීන් වෙත පැවරෙන රාජකාරීන් හා බලතල මේ සමග ඉදිරිපත් කර ඇති අතර, ඔබ ආයතනයේ රාජකාරී සඳහා යොදවන නිලධාරීන්ට, ඔවුන්ගේ රාජකාරී කටයුතු ස්වාධීනව පවත්වා ගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසන ලෙසට මෙයින් දන්වමි.

වී.ආර්.සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

වී.ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

බන්ධනාගාර බුද්ධි හා ආරක්ෂක ඒකකයයේ නිළධාරීන්ගේ වගකීම් හා බලතල පහත සඳහන් පරිදි වේ.

(i) බුද්ධි හා ආරක්ෂක ඒකකය කොමසාරිස්වරයෙකුගේ පාලනය යටතේ පවත්වාගෙන යාමටත් එම නිළධාරියා ඍජුවම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාට වගකිව යුතු වේ. (බුද්ධි ඒකක ව්‍යුහය ඇමුණුම් 01)

(ii). මෙම ඒකකයේ නිළධාරීන් බන්ධනාගාර මූලස්ථානයට අනුයුක්ත කර වෙන් වශයෙන් නවාතැන් පහසුකම් සලසා දීම.(පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය)

(iii). මෙම ඒකකයේ සියළුම තරාතිරම් වල නිළධාරීන් වෙත නියෝග හා රාජකාරී පැවරීම සිදුකරනු ලබන්නේ ඍජුවම බුද්ධි ඒකකය මගින් පමණක් වේ.

(iv). ඒකකයේ සියළුම ශ්‍රේණි වල නිළධාරීන් විසින් ඒකකයෙන් නිකුත් කරන රාජකාරී සටහන් පොතක් පවත්වා ගෙන යායුතු අතර සිදුවන සෑම විශේෂ සිදුවීමක් පිළිබඳව සටහනක් තබා අප්‍රමාදව ඒකකයට ඒ පිළිබඳව ලිඛිතව වාර්ථා කළ යුතුය. පසුව ඒ පිළිබඳව ගනු ලැබූ ක්‍රියාමාර්ග හෝ වාර්ථා සම්බන්ධව එකී සටහන් තබා එකී කටයුතු අවසන් කළ යුතුයි.

(v). ලිඛිත සටහන් හෝ කොමසාරිස්ගේ වාචික නියෝග මත මුදා හැරීමකින් තොරව වෙනත් කටයුත්තක් සඳහා රාජකාරී ස්ථානයෙන් බැහැරව නො යායුතුයි.

(vi). සෑමවිටම තමා ඉදිරියේ ඇති සියළුම දෙනාට ආදර්ශයක් වන පරිදි පිරිසිදු පූර්ණ නිළ ඇඳුමින් සැරසී අවංක නිහතමානී, ආචාරශීලී, නීති ගරුක හා විනයගරුක නිළධාරියෙක් ලෙස කටයුතු කළ යුතුයි.

(vii). නීති විරෝධී ලෙස නිළධාරියෙකුට හෝ වෙනයම් පුද්ගලයෙකුට, වාහන, භාණ්ඩ හෝ තහනම් ද්‍රව්‍ය බන්ධනාගාර තුළට ගෙනයාමට ඉඩ නොතැබිය යුතුය.

(viii). ඕනෑම නීති විරෝධී කටයුත්තක් සිදුවන අවස්ථාවක එය මැඩ පැවැත්වීමට ක්‍රියා කළ යුතු අතර අදාල ආයතන අධිකාරී, ප්‍රධාන ජේලර් වෙත, ඒකකය වෙත, අවශ්‍යතාවයට අනුව ආරක්ෂක අංශ වෙත අප්‍රමාදව දැනුම්දී ගතයුතු නිසි පියවර ගැනීමට වගබලා ගතයුතු අතර එසේ කටයුතු කිරීමට ඒකකයේ සෑම නිළධාරියෙකුම බැඳී සිටී.

(ix). බන්ධනාගාර තුළට ඇතුල් වන සියළුම නිළධාරීන්, අමුත්තන් සහ රැඳවියන් පරීක්ෂණයට භාජනය කළ යුතුවේ.

(x). සෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට හෝ තමා සේවය කරන අවට යම් ආපදාවක් සිදුවුවහොත් වහාම ඒ සඳහා ක්‍රියාත්මක වී ගතයුතු නිසි පියවර ගත යුතුය.

(xi). සෑම විටම තමාගේ, තමා සේවය කරන ආයතනයේ හෝ පරිසරය අවට හා දෙපාර්තමේන්තුවේ කීර්තිනාමය ආරක්ෂා වන පරිදි අනිසි කටයුතු සිදුවීමට ඇති ප්‍රවනතාවය ශූන්‍ය කිරීමට හැකි පරිසරයක් ගොඩනැගීම සෑම නිළධාරියෙකුගේම පරම යුතුකම වේ.

(xii). ඒකකය වෙත හෝ බැහැර ආයතනයක් වෙත සම්බන්ධවීමට අවශ්‍ය විටක ගුවන්විදුලි පණිවුඩ හුවමාරු යන්ත්‍ර හා සෑම ආයතනයකම මෙම ඒකකය වෙත සම්බන්ධ වීමට අවකාශ සලසා ඇති දුරකථනය භාවිතයෙන් එම සන්නිවේදන කටයුතු සිදුකළ යුතුවේ.

(xiii). අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සුභ සාධනය සඳහා ඉදිරිපත් වන ස්වේච්ඡා සංවිධාන සහ අනෙකුත් සංවිධාන මගින් නොයෙකුත් අවශ්‍යතාවයන් සඳහා බන්ධනාගාරය තුළට ඇතුල් වීමේදී පූර්ව අනුමැතියක් ලබාගෙන තිබේද යන්න සනාථ කරගත යුතු වේ.

(xiv). එසේම එම අවශ්‍යතාවයන් සඳහා අනුමැතිය ලබාගන්නා පුද්ගලයන් සහ භාණ්ඩ පමණක් ඇතුල්වීමට ඉඩ සැලසිය යුතුවේ.

(xv). එවැනි අමුත්තන්, පුද්ගලයන් සහ භාණ්ඩ ඔවුන්ගේ ආත්ම ගරුත්වයට හානියක් නොවන පරිදි පරීක්ෂාවට භාජනය කළයුතු වේ.

(xvi). බන්ධනාගාර සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු රැස්කළ යුතු අතර ඒ හා සම්බන්ධ සමාලෝචනයක් සෑම සතියකම ඒකකය භාරව කටයුතු කරන කොමසාරිස් මාර්ගයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුවේ.

(xvii). විශේෂ අත්‍යාවශ්‍ය සහ ක්ෂණිකව ක්‍රියා කළ යුතු බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ක්ෂණිකව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු වේ.

(xviii). රාජකාරි වියුක්තව සිටින නිළධාරීන් හදිසි අවස්ථාවකදී රාජකාරියෙහි යෙදවීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා සූදානම්ව සිටිය යුතු වේ.

(xix). බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව, ක්ෂණිකව අනෙකුත් බන්ධනාගාරයන්හි ඉහත සඳහන් ඕනෑම රාජකාරියක් ක්‍රියාවේ යෙදවීමට සූදානම්ව සිටිය යුතුය.

(xx). රාජ්‍ය අනෙකුත් බුද්ධි අංශයන් සමග සම්බන්ධවී කටයුතු කළයුතු වේ.

(xxi). බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් දේපල සහ අනෙකුත් කිසිදු දෑ නියමිත බළධාරීන්ගේ ලිඛිත අවසරයක් නොමැතිව බන්ධනාගාරයෙන් පිටතට රැගෙන යාමට ඉඩ නොදිය යුතුය.

වී.ආර් සිල්වා ආර්ඒසපී.යූඑස්පී.එන්ඩියූ.අයිපී.
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමාසාරිස් ජනරාල්.

වී.ආර්. සිල්වා ආර්ඩබ්ලිව්පී යූඑස්පී එන්ඩියූ අයිජී
මේජර් ජෙනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.